## 228 සමිඳු දෙවිඳු

සමිඳු දෙවිඳු වඳිමු රජිඳෙ ඔබ සමගයි සුහද දසු
අවදි නෙතින් දිවි ගෙවන්න දෙන්න අසිරි සදා සැපේ

රැකවරණය ලැබ දෙන්නේ සැම සත හට සමිඳාණෝ
අගහිඟකම් කිසි ලෙසකින් සැම කල්හී ඇති නොවෙතී

තිල් තණ මත මා සතපන දෙවිඳු ඔබයි සුව සැපතේ
මා ගෙනයන නිසල දියේ පහස ලබා හද පිබිදේ

නිසි මග මත මා ගෙනයේ සු නාමේ පිදුම පතා
මිටියාවත අඳුරු වුවත් සැරි සරමි බිය නෙරපා

සැරයටියයි දිගු කෙවිටයි ලැබ දෙන්නේ සැනසීමයි
මා පිණිසයි රස කරනේ බොදුන් සදා රුපු හමුවේ

හිස ගල්වා ආලේපෙන් බඳුන පිරී ඉතිරී යයි
සුහද බවේ කුලුණු බැලුම් මා පසු පස දිව එන්නේ

සියලු කලේ මා වෙසෙනෙමි සමිඳුන්ගේ සුර නිවසේ
පිය පුතුටත් සුදතුනටත් නිති කල්හී මහිමය වේ